**කොළොන්නාව නගර සභාව - 2020**
------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

කොළොන්නාව නගර සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට කොළොන්නාව නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතී රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයට අදාලව මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය** | | |
| (අ) ප්‍රමිතියේ 3.6 වගන්තිය ප්‍රකාරව ප්‍රවර්තන මූල්‍ය ප්‍රකාශන කාලපරිච්ඡේදයේ ඉදිරිපත් කර ඇති සියලුම වටිනාකම් සඳහා, පෙර වූ සමාන කළ හැකි කාලපරිච්ඡේදය සම්බන්ධ සැසඳිය හැකි තොරතුරු තුලනාත්මකව හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | ප්‍රමිත හා ගැසට් පත්‍රය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) ප්‍රමිතියේ 3.9 වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල අයවැයගත තොරතුරු, එනම් මුල් අයවැය, අවසාන අයවැය සහ ඒ අතර ප්‍රමාණාත්මක වෙනස්වීම් ඇත්නම් ඒවාට හේතු හෙළිදරව් කිරීම් ආදිය සිදුකර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී ගිණුම සකස් කිරීමේදී අයවැයගත තොරතුරු සහිතව ඉදිරිපත් කරමි. | |
| (ඇ) ප්‍රමිතියේ 6.3 වගන්තිය ප්‍රකාරව ඉඩම් හා ගොඩනැගිලි වෙන් වෙන් වශයෙන් දේපළ, පිරියත හා උපකරණ යටතේ හෙළිදරව් කළ යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි. තවද, ඉඩම් දේපළ, පිරියත හා උපකරණ ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | 2021 වර්ෂයේදී ගිණුම්ගත කරමි. | |

| | | |
|---|---|---|
| (ඇ) ප්‍රමිතියේ 6.20 වගන්තිය ප්‍රකාරව වාර්තාකරණ කාල පරිච්ඡේදයට අදාළව දේපළ, පිරියත හා උපකරණ සම්බන්ධයෙන් හානිකරණ පිළිබඳ විස්තරයක් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී ගිණුම්වලින් නිවැරදි කිරීමට කටයුතු කරමි. | ප්‍රමිත හා ගැසට් පත්‍රය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඉ) ප්‍රමිතියේ 15.13 වගන්තිය ප්‍රකාරව සභාවේ හුවමාරුවන හා හුවමාරු නොවන ගණුදෙනුවල ලැබිය යුතු දැ වල අයකර ගත නොහැකි ලෙස ලියාහැරීමේ යම් වටිනාකම් හා ඒ සඳහා අනුමැතිය වෙන් වෙන් වශයෙන් හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී ගිණුම්වලින් නිවැරදි කිරීමට කටයුතු කරමි. | |

**1.6.2 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සභාව සතු රු.5,352,300,000 ක් වටිනාකමැති ඉඩම් 27 ක් මූල්‍ය ප්‍රකාශනවල දේපළ, පිරියත හා උපකරණ ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | නගර සභාව සතු ඉඩම් ප්‍රත්‍යාගණනය කිරීමෙන් පසු 2021 වර්ෂයේදී ගිණුම්ගත කරමි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ ඌනතා/ අතිරික්තයේ ඇතුළත් නොවූ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම ලෙස ශේෂ පිරික්සුම අනුව රු.13,459,770 ක බැර ශේෂයක් ඇතත් එයට අදාල පොදු ලෙජර් ගිණුමක් නොතිබුණි. නමුත් මූල්‍ය ප්‍රකාශනයේ ප්‍රාග්ධන ප්‍රදානයන් ලෙස රු.15,133,841ක් ගිණුම්ගත කර තිබුණු අතර එම ප්‍රදානයෙන් වර්ෂය තුළ දරන ලද රු.1,674,071 ක් ප්‍රාග්ධන වියදම් ගිණුම්ගත කර නොතිබුණි. | සමාලෝචිත වර්ෂයේ ඌනතා / අතිරික්තයේ ඇතුළත් නොවූ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමේ ශේෂය රු.13,459,770 ලෙස ශේෂ පිරික්සුමේ දක්වා ඇතත් එයට අදාල පොදු ලෙජරයේ ගිණුමක් නොතිබුණු අතර ඉදිරි වර්ෂයේදී ඒ සඳහා ගිණුමක් පවත්වාගෙන යාමට කටයුතු කරමි. | |
| (ඇ) නව සභා රැස්වීම් ශාලාව ඉදිකිරීම සඳහා 2020 දෙසැම්බර් 10 දින රජයෙන් ලද රු.2,000,000ක්, 2020 නොවැම්බර් 03 කර්මාන්ත සඳහා රජයෙන් ලද රු.2,800,000 ක් හා 2020 දෙසැම්බර් 08 දින ගම්පෙරළිය වැඩසටහන යටතේ ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන රු.335,203ක් සමුච්චිත අරමුදලේ අතිරික්ත හා ඌනතා ගිණුමට බැර කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රදාන අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | 2020 වර්ෂයේදී සමුච්චිත අරමුදලට ප්‍රමාද දෝෂයකින් බැර වී ඇත. 2021 වර්ෂයේදී ගිණුම් සකස් කිරීමේදී නිවැරදිව ගිණුම්ගත කරමි. | |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2020 වර්ෂයේදී රු.7,286,645 ක වටිනාමින් යුතු සහා කර්මාන්ත 12 ක වැඩ අවසන් වී නොමැති අතර මූල්‍ය ප්‍රකාශනවල කෙරීගෙන යන වැඩ යටතේ දක්වා නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශනවල කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ඉ) | ජ'නල් අංක 70 මගින් රජයේ ප්‍රාග්ධන ආධාර රු.15,053,337 ක් ණයහිමි ගිණුම්ගත කිරීමේදී කෙරීගෙන යන වැඩ වෙනුවට ගොඩනැඟිලි රු.2,777,503 ක් හා පාරවල්, බෝක්කු වෙනුවෙන් රු.12,275,834 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශනවල කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. | |

**1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 02 කට අදාල මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම හා උපලේඛන අනුව වටිනාකම අතර රු.3,826,585 ක වෙනසක් නිරීක්ෂණය විය. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | ලේඛන හා උපලේඛන නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. |

**1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.59,747,113 ක් වූ ගිණුම් විෂයයන් 07 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | අදාල අනුමැතිය හා විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.19,217,504 ක් වූ අතර ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.82,914,518 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **වරිපනම් හා බදු**<br>සමාලෝචිත වර්ෂය අවසාන දිනට හිඟහිටි වරිපනම් වටිනාකම රු.48,408,473 ක් වූ අතර එයින් රු.40,000 කට වඩා වැඩි හිඟ වටිනාකමක් ඇති වරිපනම් හිඟ ශේෂ 90 කින් අයවිය යුතුව තිබූ මුදල රු.22,050,406 ක් විය. තවද රු.3,728,661 ක වරිපනම් ණයගැති ශේෂය හඳුනාගැනීමට අදාල විස්තරාත්මක උපලේඛණ ඉදිරිපත් නොවුණි. | ඉදිරියේදී දේපළ තහනම් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කර ඉතිරි හිඟ මුදල් කඩිනමින් අය කර ගැනීමට හා ඉදිරියේදී නිවැරදි ලෙස උපලේඛන ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | දේපළ තහනමට ගැනීම හෝ අධිකරණ ක්‍රියාමාර්ග වැනි ක්‍රම මගින් හිඟ ආදායම් අයකර ගැනීමට කඩිනමින් පියවර ගත යුතු අතර අදාල උපලේඛන ඉදිරිපත් කළ යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 අයවැය ප්‍රතිපාදන යටතේ කොළොන්නාව නගර සභා බල ප්‍රදේශයේ ජීවත්වන අඩු ආදායම්ලාභී පවුල්වල දූ දරුවන්ට පාසැල් පොත් හා උපකරණ බෙදාදීමේ වැඩසටහනට අනුව දරුවන් 2150 ක් සඳහා අවශ්‍ය පොත්පත් හා උපකරණ 2019 දෙසැම්බර් 31 දිනැති වවුචර් අංක 2839 මගින් රු.940,438 කට මිලදීගෙන තිබුණු අතර එයින් රු.252,223ක් වටිනාකමැති පොත් පාර්සල් 598ක් 2021 ජනවාරි 26 දින වනවිටත් ගබඩාවේ නොබෙදා ඉතිරි වී තිබුණි. මෙහිදී අඩු ආදායම්ලාභී පවුල්වල දූ දරුවන් කවුරුන්ද යන්න හඳුනා ගැනීමකින් තොරව මිලදී ගැනීම හේතුවෙන් මෙම බෙදාහැරීමේ ප්‍රමාදය සිදු වී ඇති බව නිරීක්ෂණය විය. | දෙවරක්ම මෙම පොත් බෙදා දීමේ වැඩසටහන සඳහා කටයුතු සූදානම් කළත් විවිධ ගැටලු හමුවේ මෙම කාර්යය, යොදාගත් දිනයන්හිදී සිදු කිරීමට නොහැකි විය. සන්නිවේදන ගැටලු හේතුවෙන් පොත් බෙදාදුන් දිනයේ ප්‍රමාණවත් ඉල්ලුම්කරුවන් ප්‍රමාණයක් නොපැමිණීම මෙසේ පොත් පාර්සල් ඉතිරි වීමට හේතු විය. | පාසැල් පොත් හා උපකරණ බෙදාදීමේදී අවශ්‍ය අඩු ආදායම්ලාභී පවුල් හඳුනාගෙන ඒ අනුව මිලදී ගැනීම් සිදුකර කඩිනමින් අදාල බෙදාහැරීම් කිරීමට කටයුතු කළ යුතු වේ. |